## වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුධය පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) ප්‍රකාශය

***2018 ඔක්තොම්බර් 29 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව:*** ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා තනතුරෙන් ඉවත් කොට මහින්ද රාජපක්ෂ මහතා ඒ වෙනුවට අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කිරීමේ අපේක්ෂාවෙන් ගනු ලැබූ උත්සාහය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හැකි උපරිම දැඩිභාවයෙන් යුතුව හෙළා දකී. අප දැඩි ලෙස විශ්වාස කරන්නේ මෙම ක්‍රියාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල නොවන සහ නීති විරෝධී ක්‍රියා වන බව සහ කිසිසේත්ම ප්‍රජාතාන්ත්‍රික සුජාතභාවයකින් යුතු නොවන ඒවා වන බවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වන සංශෝධනය (2015) මගින් අග්‍රාමාත්‍යවරයා ධූරයෙන් ඉවත් කිරීමට ජනාධිපතිවරයා සතුව තිබූ බලතල ඉවත් කරන ලදි. මෙම තත්වය ව්‍යවස්ථා 42(4), 46(2) සහ 48 හී ප්‍රතිඵලය වෙයි. ව්‍යවස්ථා 42(4) ප්‍රකාරව චාරිත්‍රානුකූල ලෙස අග්‍රාමාත්‍යවරයා පත් කිරීමේ කාර්යය තවමත්  ජනාධිපතිවරයා සතු වුවද එය ජනාධිපතිවරයාගේ මනෝමූල තීරණයක් හෝ බලයක් නොවේ. එපමණක් නොව එහිදී ඔහු ක්‍රියා කරන්නේ මෙම ව්‍යවස්ථා ප්‍රතිපාදනයන් යටතේ සහ අග්‍රාමාත්‍යවරයා වෙත වන පාර්ලිමේන්තුවේ විශ්වාසයටද යටත්වයි. අනෙක් අතට අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම අවසන් විය හැකි තත්වයන් දැන් නිශ්චිත හා විධිමත් ලෙස ආණුඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් දක්වා ඇත. අග්‍රාමාත්‍යවරයා මරණය, ඉල්ලා අස්වීම, පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය දැරීම අවසන් වීම යනා දී ක්‍රමවලින් ධූරය දැරීම අවසන් නොවුවහොත් ඔහුගේ ආග්‍රාමාත්‍ය ධූරයෙන් ඔහු ඉවත් කල හැකි එකම ආකාරය වනුයේ ව්‍යවස්ථා 48(2) ප්‍රකාර අයවැය හෝ රාජාසන කථාව පරාජය වීමෙන් හෝ ඔහුට එරෙහිව ගෙනඑනු ලබන විශ්වාසභංග යෝජනාවක් පරාජය වීම මගින් පමණකි. 2018 ඔක්තොම්බර් 26 වැනි දා ජනාධිපතිවරයා විසින් අග්‍රමාත්‍යවරයා ඉවත් කිරිමේ අපේක්ෂාවෙන් සිදු කළ ක්‍රියාවන්ට පෙර, ඊට අවශ්‍ය පූර්ව කොන්දේසියක් ලෙස, පාර්ලිමේන්තුව විසින් අග්‍රාමාත්‍යවරයා කෙරෙහි විශ්වාසයක් නොමැති බව ප්‍රකාශකොට නොමැත.

එක්සත් ජනතා නිදහස් සංධානය (UPFA) ජාතික රජයෙන් ඉවත් වීමෙහි ප්‍රතිඵලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(5) ප්‍රකාර, කැබිනට් මණ්ඩලය විසුරුවනු ලැබීමකට හා අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම අවසන් වීමකට හේතුවන බවට වන තර්කය අපි දැඩි ලෙස හෙළා දකින්නෙමු. මෙම තර්කය පදනම් වන ව්‍යවස්ථා 48(1) හි යටින් පවතින තාර්කිකය වන්නේ අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම අවසන් වන විටක දී කැබිනට් මණ්ඩලය විසුරුවනු ලැබීම මිස එහි අනෙක් පැත්ත නොවේ. අදහස් කරන ලද අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම නීත්‍යානුකූල නොවන විටක දී කැබිනට් මණ්ඩලය විසුරුවා හරිනු ලැබීමක් ද සිදු විය නොහැකිය.

රහසින් සැලැසුම්කොට මුළු රටම මවිතයකින් සහ විශ්වාස කල නොහැකි බවකින් වෙලාගත් පසුගිය සිකුරාදා රාත්‍රියෙහි සිදු වූ ජනාධිපතිවරයාගේ ක්‍රියාවන්ගේ නිත්‍යානුකූලබවක් සහ සුජාතභාවයක් නොමැති බව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු රැස්වීම් ද කල් තැබීම මගින් තවත් උග්‍ර කරවනු ලැබ ඇත. අග්‍රාමාත්‍යධූරයක් දිගටම පවත්වාගෙන යාම හෝ අග්‍රාමාත්‍යවරුන් වෙනස් කිරීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අධිකාරී බලය ඇත්තේ පාර්ලිමේන්තුවට පමණකි. එහි සැසිවාරය කල් තැබීම මගින් මේ රට දැන් ඇද වැටී ඇති පෙර නොවූවිරූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුධය විසඳාගැනීමට ඇති ඉඩකඩ ද

අහිමි වේ. එපමණක් නොව ඒමගින් ජනාධිපතිවරයා විසින් අපේක්ෂා කරනු ලැබූ නව අගමැතිවරයකු පත් කර ගැනීමෙහි ප්‍රජාතාන්ත්‍රික සුජාතභාවය ද මූලික වශයෙන් අභියෝගයට ලක් වේ.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය ශ්‍රී ලංකාවේ පෙර නොවූ විරූ තත්ත්වයක් වන අතර රජයක නීත්‍යානුකූලභාවය සහ සුජාතභාවය මෙසේ ප්‍රශ්න කරනු ලැබීමක් කිසිදා සිදු වී නොමැත. මේ පිළිබඳව අපි කනගාටුවට පත්වන අතර මෙම අනවශ්‍ය අර්බුධය සහ ප්‍රජාතන්ත්‍රවාදයේ අපගමණය ඇති කල ක්‍රියාමාර්ගය ද හෙළා දැක සිටින්නෙමු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ අධිපත්‍ය සහ යහපාලනය ශක්තිමත් කිරීමේ ජන වරමකින් තේරී පත් වූ ජනාධිපතිවරයකු මෙවැනි මාර්ගයක් තෝරා ගැනීම මවිතය දනවන සහ බලාපොරොත්තු සුන්කරවනසුලු තත්වයක් බව කිව යුතුව ඇත.

එබැවින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලය මාරු කිරීම සඳහා ගන්නා ලද මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල නොවන උත්සාහය පිළිබඳව කරන ලද ඉතා පැහැදිලි හෙළාදැකීම නැවත ප්‍රකාශකර සිටීමට කැමැති වෙයි. මෙම කරුණ අවසන් ලෙස තීරණය කිරීම සඳහා වහාම පාර්ලිමේන්තුව නැවත කැඳවන ලෙස ද අපි ඉල්ලා සිටින්නෙමු.

අවසන් වශයෙන් මෙම සති අන්තයේ මේ සිදුවීම ආශ්‍රිතව ඇති වූ ප්‍රචණ්ඩත්වය නිසා සිදු වූ පළමු මරණය පිළිබඳවද අපගේ දැඩි සැලැකිල්ල යොමු කර සිටින්නෙමු. මෙම අර්බුධය තුන්වන දිනය දක්වා දිගටම ඇදී යද්දී, අර්බුධයට ඉක්මන් පිළියම් නොයෙදුව හොත් සිදු විය හැකි ප්‍රචණ්ඩත්වයේ ඉහල යෑමක් පිළිබඳව වූ සැබෑ බියක් ජනනය වෙමින් පවති. දේශපාලන ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට සහ සියලු පුරවැසියන්ගේ ජීවිත ආරක්ෂා කිරීම පිණිස වත්මන් අර්බුධය වහාම විසඳීම අතිශයින් වැදගත් වේ.